**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය)

සමාජ වැඩ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අයදුම් පත් කැඳවීම - 2025/2026 අධ්‍යයන වර්ෂය

ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයකි. එය සමාජ වැඩ වෘත්තිය අධ්‍යාපනය ලබා දෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනය ද වෙයි. දැනට මෙම ආයතනය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන අතර මෙම ආයතනය මගින් පිරිනමනු ලබන පූර්ණ කාලීන සිව් අවුරුදු සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

අයදුම් කිරීමේ සුදුසුකම් :

2022, 2023 සහ 2024 යන වර්ෂවලදී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී ඕනෑම විෂය ධාරවකින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහාවන අවම සුදුසුකම් සපුරා ඇති හා පොදු පරීක්ෂණය සඳහා ලකුණු තිහක් (30) හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අය සඳහා පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හැදෑරීමට අයදුම් කිරීම සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂය සඳහා හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම අනිවාර්ය වේ.

*උපාධිය පැවැත්වෙන මාධ්‍ය :* සිංහල/දෙමළ/ඉංග්‍රීසි

තෝරාගැනීමේ ක්‍රමවේදය :

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්, පාඨමාලාව හැදෑරීමට අයදුම් කළ මාධ්‍යයෙන් පත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර ලිඛිත පරීක්ෂණයේ හා සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවය මත තෝරා ගැනීම් සිදු කරයි. තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණය අයදුම්පත් කැඳවන අවසාන දිනයෙන් පසු ආසන්න දිනක දී ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සීදූව ප්‍රධාන කාර්යාලයේ දී හෝ පළාත් මට්ටමින් පවත්වනු ලබයි. තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය දැනීම, අභියෝග්‍යතා හා ඉංග්‍රීසි භාෂා දැනුම පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වෙයි.කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයට ඉදිරිපත්වීම සඳහා විභාග ගාස්තු වශයෙන් රුපියල් දහසක මුදලක් (රු. 1,000/-) ගෙවිය යුතුයි.

*පාඨමාලා ගාස්තු :* මෙම සිව් අවුරුදු පූර්ණ කාලීන උපාධි පාඨමාලාව නොමිලේ පවත්වනු ලබන අතර ලියාපදිංචි ගාස්තු වශයෙන් රුපියල් 35,000/- ක මුදලක් පමණක් අයකරනු ලබයි.

*අයදුම් කරන ආකාරය :*

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (www.nisd.ac.lk) ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහාවන අයදුම්පත්‍රය බාගත කර, නිවැරදිව සම්පූර්ණ කර සහතික කරන ලද පිටපත් සහිතව ලේඛකාධිකාරි, ජාතික සමාජ සංවර්ධන ආයතනය, ලියනගේමුල්ල, සීදූව, ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුයි.

*අයදුම්පත් ගාස්තුව :* රුපියල් පන්සියයක මුදලක් (රු.500/-) පහත ගිණුම් අංකයට බැර කර එහි ලදුපත අයදුම්පත්‍රය සමග යොමු කළ යුතුයි. අයදුම් පත්‍ර ගාස්තුව නොගෙවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප වේ.

ගිණුම් හිමියා - අධ්‍යක්ෂ ජනරාල්
ගිණුම් අංකය - 143-1001-2-3298037 (මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව)

අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය : **2025 සැප්තැම්බර් මස 22 වැනි දින.**

ලේඛකාධිකාරී.

ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදූව.
Tel : 0112882506
Email: registrar@nisd.ac.lk

08-233

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.